# ශ්‍රී ලංකාවේ බුද්ධාගම යනු එවකට පැවති පූර්ව බෞද්ධ ආගම් එක්කොට තැනුණු සම්මිශ්‍රිතයක් ද?[1]

එම්. එම්. ජේ. මාරසිංහ

බුද්ධාගමේ කර්තෘන් වන බුදුන්වහන්සේත් බුදුන් දෙසූ ධර්මයත් ගැන න්‍යායික වශයෙන් සොයා බලන විට, එම කර්තෘන් ද න්‍යායය ද දැඩි ලෙස අදේවවාදී බැව් පෙනේ. බුදුන් සර්වබලධාරී දෙවිකෙනෙකුගේ පැවැත්ම ඉඳුරා ප්‍රතික්ෂේප කළ ආගමික ශාස්තෘවරයෙකි. බුදුන් කියා සිටියේ දෙවියාත් දේවයාතුකර්මත් හුදු ප්‍රබන්ධ කථා බවයි. බුදුන් පිරිනිවී අවුරුදු සිය ගණනකට පසුව බුදුන්ගේ චරිත කථාව ලියූ අශ්වඝෝෂ ද බුදුන්ගේ අදේවවාදීත්වය ගැන උදාහරණ සහිතව කියා තිබේ.

සූත්‍ර පිටකයේ සහ බුද්ධ චරිතයේ මොනවා ලියැවී තිබුණත් වර්තමාන බහුතර බෞද්ධයාට, විශේෂයෙන් ගත් කළ බහුතර සිංහල බෞද්ධයාට නම් බුදුන් දෙවියෙකි; බුදුන්ගේ ධර්මය තමන්ට පිහිටවන දේවධර්මයකි. කතරගම, විෂ්ණු වැනි දේවරූපවලට කන්නලව් කරන අන්දමට බුදු පිළිමවලට සහ බෝ ගස්වලට සිංහල බෞද්ධයා කන්නලව් කරන්නේ ඒ නිසා ය. මේ උඩුයටිකුරු විපරිවර්තනයට ඉතා දීර්ඝ ඉතිහාසයක් ද තිබේ.

අද දවසේ බුදුදහම පවත්වාගෙන යාම සඳහා බෞද්ධ ශාසනයට ඇතුළු වී සිටින බුද්ධ ශ්‍රාවකයන් මේ පරිවර්තනය ගැන සොය බලන්නේ නැත. ඒ කාරණා දෙකක් නිසා ය. එකක්, මේ යාතුකර්මීය ක්‍රියාවලිය වනාහි තමන්ට ධනසම්පත් ලබාදෙන ධනෝපායන මාර්ගයක් නිසා ය. දෙවැන්න, අදේවවාදී බෞද්ධ න්‍යාය ගැන ඔවුන්ට තිබෙන අල්ප දැනුම නිසා ය. ගිහි

---

[1] ප්‍රවාද 33 (2011) වෙලුමෙහි ද පළ වූ මෙම ලිපිය පළමු වරට *The Island* පුවත්පතේ පළ වූවකි.

බෞද්ධ බහුතරය සිතන්නේ පන්සලට ගොඩනැගිලි ලබා දීමෙන්, පන්සලේ හාමුදුරුවන්ට සම්පත් ලබා දීමෙන්, බෝගස් වන්දනා කිරීමෙන්, පිළිම වැඳීමෙන්, දේවාලවල කරක් ගැසීමෙන් බෞද්ධයාට විමුක්ති මාර්ගය උදාවනවා කියා ය. පොදුවේ අද බෞද්ධ න්‍යාය සහ භාවිතාව එතැනට ලඝු කොට ඇත්තේ ය. ලේඛකයා උත්සාහ ගන්නේ මේ කාරණා ගැන කෙරෙන දීර්ඝ කතිකාවක් සඳහා මුල පුරන්නට ය.

පිළිගත් ඓතිහාසික වාර්තාවලට අනුව බුද්ධාගම නිල වශයෙන් ලංකාවට හඳුන්වා දී ඇත්තේ ක්‍රි.පූ. තුන්වන සියවසේ රජ කළ දේවානම්පියතිස්ස රජුගේ පාලන සමයේදී ය. එය මෙරටට ගෙන එන ලද්දේ මහින්ද හිමියන් නායකත්වය දෙන ලද බෞද්ධ ධර්මදූත කණ්ඩායමක් විසින් ය. මොග්ගලිපුත්ත තිස්ස හිමියන්ගේ මගපෙන්වීම යටතේ පාටලිපුත්‍ර නුවරදී පවත්වන ලද තුන්වැනි බෞද්ධ ධර්ම සංඝායනාව අවසානවීමෙන් පසුව අශෝක අධිරාජයා විසින් ආසියාවේ විවිධ ප්‍රදේශවලට පිටත්කොට හරින ලද ධර්මදූත කණ්ඩායම් ගණනාවකින් එකක් හැටියට ලංකාවට පැමිණි කණ්ඩායම හඳුනාගත හැකිය.

මෙලෙස ලංකාවට හඳුන්වා දෙනු ලැබූ බුද්ධාගම පාලි සූත්‍ර පිටකයේ සඳහන් බුද්ධ ධර්මයයි. පාලි සූත්‍ර පිටකය වනාහි බුදුන්ගේ ඉගැන්වීම් වාර්තාකොට තිබෙන වාර්තා අතුරින් වඩාත් තථ්‍ය වාර්තාව ලෙස අතීතයේ සිටම පිළිගැනී තිබිණ. අද දවසේ පඨිතමය සම්ප්‍රදායක් ලෙස දක්නට ලැබෙන ඉන්දීය ආගම් බොහොමයක්ම අතීතයේ සිට පවත්වාගෙන එන ලද්දේ මුඛ පරම්පරාගත සම්ප්‍රදා ලෙසින් ය. එලෙස මුඛ පරම්පරාවෙන් පැවත ආ බෞද්ධ පාලි සම්ප්‍රදාය පඨිතමය සම්ප්‍රදායක් බවට පෙරලන ලද්දේ ක්‍රි.පූ. පළමුවන සියවසේ ලංකාවේ රජ කළ වළගම්බාහු රජ දවස මාතලේ පිහිටි ආලෝක විහාරයේදී ය. එතැන් පටන් සූත්‍ර පිටකය පඨිතමය රූපයෙන් ව්‍යවහාරයේ පවතී.

ලංකාවේ බෞද්ධ සම්ප්‍රදාය යනු පාලි සූත්‍ර පිටකවල දැක්වෙන බෞද්ධ සම්ප්‍රදාය එකදිගටම පවත්වා ගැනීමක් යන කාරණය ඇත්තකි. එහෙත් අද දවසේ ඒ ඇත්ත විචාරයෙන් තොරව පිළිගැනීම එන්න එන්නම දුෂ්කර වෙමින් තිබෙන බව කිව යුතු ය. මන්ද කියනවානම්, අද දවසේ භාවිතයේ

පවතින යාතුකර්මීය ආගම තුළ දක්නට ලැබෙන සූත්‍රමය අපේක්ෂාවන් ඉතාමත් දරුණු අපගමනයකට භාජනය වී තිබෙන නිසා ය. මේ කාරණය මේ අවස්ථාවේදී වැඩිදුරටත් පැහැදිලි කිරීම අවශ්‍ය ය. ඓතිහාසික වාර්තාවලට අනුව, ලංකවට බුද්ධාගම හඳුන්වාදෙන ලද මුල් දවස් කීපයේ සිටම එහි ඉගැන්වීම් ජන කොටස් දෙකක අවධානයට යොමු වී තිබේ. එක ජන කොටසක් අයත් වන්නේ බුදුදහමේ ඉගැන්වීම්වල වැදගත්කම උකහාගෙන එහි ඉගැන්වෙන විමුක්තිය අත්පත් කරගැනීම සඳහා නිර්භීත පියවර තැබූ කාණ්ඩයට ය. ඓතිහාසික වාර්තාවලට අනුව, එවැනි අනුගාමිකයන් අතිවිශාල ප්‍රමාණයක් පහළ වූ හෙයින් එදවස දේශපාලන අධිකාරය විහාරාරාම ගොඩනගා ඔවුන්ගේ අවශ්‍යතා ඉටුකර දුන්නා ය.

රට තුළ බුද්ධාගමේ දීප්තිමත් දැල්ල නිවී යා නොදී රැකගන්නේ බෞද්ධ ආධ්‍යාත්මික පුහුණුව ලද මේ පිරිස ය. එදා පැවතුණු ආගමික වාතාවරණය තුළ දක්නට ලැබුණු කැපවීමේ ප්‍රමාණය සුප්‍රකට බෞද්ධ අට්ඨකථාචාරී හිමිනම විසින් සම්පාදිත යුගනිර්මාණක **විසුද්ධිමග්ග** කෘතියෙන් මනින්නට පුළුවන් යැයි මම සිතමි. මේ කෘතිය වූකලි සූත්‍ර පිටකයේ දැක්වෙන දැනුම් සම්භාරය ආධ්‍යාත්මික පුහුණුව අරබයා යොදාගන්නේ කෙසේ දැයි තර්කානුකූලව ක්‍රමානුකූලව කියාදෙන්නකි. අදත් එම ආධ්‍යාත්මික පුහුණුව දිවයින පුරා විසිරී තිබෙන ආරණ්‍ය සේනාසන සහ භාවනා මධ්‍යස්ථාන විසින් ඉතා සුළු පිරිසකට වුව ද ලබාදෙමින් එම ආධ්‍යාත්මික සම්ප්‍රදාය රැක ගනිමින් සිටින බව සොම්නස් සිතින් සඳහන් කළ යුතු ය.

දෙවන ජනකොටස නම් පූර්ව-බෞද්ධ ගෝත්‍රික ආගම් අදහමින් තමන්ට හුරුපුරුදු යාතුකර්ම මත පදනම් වූ ආගම වෙතම නැඹුරු වී සිටි උදවියයි. මහින්ද හිමියන් විසින් බෝධි වෘක්ෂයේ අංකුරයක් සහ ඉදිකිරීමට නියමිත ස්තූපවල තැම්පත් කිරීම සඳහා බුදුන්ගේ ධාතු ගෙන්වා ගත්තේ ද මේ ජනකොටස් තෘප්තිමත් කරනු සඳහා ය.

යාතුකර්මීය භාවිතාවන් පාලි සූත්‍ර පිටකවල එන ඉගැන්වීම් සම්ප්‍රදායේ අංගයක් වී නොතිබුණු සමයෙකදී මහින්ද හිමියන් එවන් භාවිතාවන් ලංකාවේ බුද්ධාගමට ඇතුළත් කළේ ඇයි ද යන්න අවබෝධ කර ගැනීම ඇත්තෙන්ම දුෂ්කර ය. එහෙත් ඒ වනවිට ඉන්දියාවේ වැජඹුණු මෞර්ය

අධිරාජ්‍යයේ දේශසීමාවේ ඇතුළු හා පිටත කලාපවල භාවිතාවේ තිබුණු දැවැන්ත ආගමික-යාතුකර්මීය සංකලනය වෙත ඉතා සමීප බැල්මක් හෙළන විට එකී තත්ත්වය අවබෝධ කරගැනීම දුෂ්කර නැත. ඉදින්, ඒ පිළිබඳ අවබෝධයක් ලබාගැනීම ඉතා වැදගත් ය. එමෙන්ම අතිශයින් අදාළ ය. මන්ද කියනවානම්, ඉන්දියාවේ තිබුණු බ්‍රාහ්මණවාදී ආගමික ආධිපත්‍යය සහ ආර්ය සම්ප්‍රදාය මුළුමනින්ම වාගේ විපරීත කළේ මෙකී යාතුකර්මයෙන් සජ්ජිත බුද්ධ ධර්මය නිසා ය.

මෞර්ය අධිරාජ්‍යයේ බලගතු මධ්‍යගත දේශපාලන යාන්ත්‍රණය පිහිටුවා තහවුරු කිරීමත් සමගම එම මධ්‍යගත ආණ්ඩුවට අභියෝග කළ හැකි තර්ජනයක් එල්ල කළ හැකි එකදු ගෝත්‍රයක්වත් ඉතුරු වී සිටියේ නැත. වෙනත් විදියකින් කියනවානම්, එහි තේරුම නම්, දැවැන්ත අශෝක අධිරාජ්‍යයේ දේශසීමා මායිම් පුරා කුඩා ගෝත්‍රික ජනකණ්ඩායම් දහස් ගණනාවක් විසිරී ජීවත් වූ බවත් බුදුන්ගේ කාලයේදී මෙන් කෝසල මගධ අධිරාජ්‍යවල තාඩන පීඩනවලට ගෝත්‍රික ජන කණ්ඩායම් භාජනය නොවූ බවත් ය. ඒ වාගේම, අධිරාජ්‍යය තව තවත් පුළුල් කිරීම සඳහා අධිරාජ්‍ය දේශසීමාවේ තිබුණු ගෝත්‍රික වාසභූමි ඉවත් කරගන්නා ලෙස අධිරාජ්‍යය ඉල්ලුම් කර සිටියේ ද නැත. එබැවින්දෝ, මේ ගෝත්‍රික වාසභූමිවල ජීවත් වූ ගෝත්‍රික ජනයා ඔවුන්ගේ වාසභූමියට යාබදව ජීවත් වූ මහා ප්‍රජාවේ සාමාජිකයන් සමග සැකයෙන් තොරව සාමයෙන් ආශ්‍රය කළෝ ය. දේශපාලන බලය යෙදවූයේ නැති හෙයින් ද එවැන්නක අවශ්‍යතාව පැනනොනැගුණු හෙයින් ද මධ්‍යම රජයේ දේශසීමා ව්‍යාප්තවීම් එකදිගටම සිද්ධවූයේ සාමකාමී ලෙස ය. ඒ අනුව, අපට ඉදිරියේදී දැකගන්නට ලැබෙන පරිදි, මේ දේශසීමා ප්‍රදේශවල දැවැන්ත විපරිවර්තන ද සිද්ධ විය.

මේ විපරිවර්තනවල පුරෝගාමියා වූයේ ක්‍රි.පූ. හයවන සියවසේ සිටම එතෙක් බුක්ති විඳි සුපිරි තත්ත්වය අතින් ඉතා දරුණු පිරිහීමකට ලක්ව සිටි බ්‍රාහ්මණ පූජකයා ය. කෝසම්බිට අනුව සාකච්ඡා කළොතින් ඒ විත්තිය මෙසේ ය: 'එතෙක් සුරැකී තිබුණු කුමන ගෝත්‍රයක් වේවා කුමන කුල ශිල්පි ශ්‍රේණියක් වේවා ඒ හැමෙකකටම බ්‍රාහ්මණ පූජකයා ක්‍රමානුකූලව ඇතුළු වී ඒවා තුළට කිඳා බැස්සේ ය. අද වනතුරු දියත්

වන්නේ එම ක්‍රියාවලියයි. එහි තේරුම නම් නව දෙවිවරුන්, එනම් ඇලෙක්සැන්ඩර්ගේ ආක්‍රමණයට පෙරාතුව පන්ජාබ් තැන්නෙන් ඉන්ද්‍ර දෙවියාව එළවා දැමූ ක්‍රිෂ්ණා දෙවියා වැනි දෙවිවරුන් වඳින්නට පුදන්නට පටන්ගත් බවයි. එහිදී ගෝත්‍රික යාතුකර්මවල සහ තාන්ත්‍රික ලබ්ධීන්වල අඩංගු සුවිශේෂ ලක්ෂණ විපර්යාස වන්නට පටන්ගති. ගෝත්‍රික දෙවිවරුන් ප්‍රමිතිගත බ්‍රාහ්මණ දෙවිවරුන් සමග සම කරන්නට පටන් ගැනුණු අතර සමාග්‍රහණය කරගත නොහැකි ගෝත්‍රික දෙවිවරුන් නම්බුකාර දෙවිවරුන් බවට පත්කිරීම සඳහා බ්‍රාහ්මණ සූත්‍ර ද රචනා කරනු ලැබී ය. මේ දෙවිවරුන් සහ නව අනන්‍යතාවන් සමගම නවයාතුකර්ම මෙන්ම සුවිශේෂ නිරීක්ෂණ සඳහා කැපවූ දින ද චන්ද්‍ර දිනදර්ශනයට හඳුන්වා දෙනු ලැබී ය. මේ දෙවිවරුන් ලැග සිටි ම්ලේච්ඡ පූර්ව-බ්‍රාහ්මණ ලබ්ධි-ස්ථානවලින් ඔවුන් ඉවත් කරවා, ඔවුන් නම්බුකාර කරවනු පිණිස ඔවුන් වටා සුදුසු කතන්දර ගොතා, නව වන්දනා ස්ථාන ද පිහිටවනු ලැබී ය. **මහාභාරත**, **රාමායන** සහ **පුරාණ** ආදී ග්‍රන්ථ පිරී තිබෙන්නේ ඒ කතන්දරවලිනි. ඉදින්, මේ සමාග්‍රහණ යාන්ත්‍රණය ඉතා රසවත් එකකි. ක්‍රිෂ්ණාට පමණක් නොව බුදුන්ටත් යම් යම් ගෝත්‍රික දෙවිවරුන්ගේ ගෝත්‍ර ලකුණු ලෙස දැක්වෙන මාළුවා, ඉබ්බා, වල් ඌරා වැනි සතුන් ද විෂ්ණු නාරායන්ගේ අවතාර ද ආරෝපණය කරනු ලැබී ය. ගොවි ජනයා අතරේ පුළුල් ලෙස ඇදහිල්ලට පාත්‍රව සිටි, තමන්ටම ආවේණික ස්වාධීන ලබ්ධියක් සහිත දෙවියකු වූ හනුමන්, විෂ්ණුගේ තවත් අවතාරයක් වන රාමාගේ කීකරු සේවකයා බවට පත්විය. පොළොවෙන් උපන් නාගරාජයාගේ දැවැන්ත පෙණය යටට ගිය විෂ්ණු නාරායන ජලය මත සැප නින්දක ගැලී සිටින්නට පටන් ගති. එම නාගරාජයා එම අවස්ථාවේදී ම එකවරම ශිවගේ පළඳනාවක් හැටියටත් ගනේෂගේ ආයුධයක් හැටියටත් ක්‍රියා කරන්නේ ය. ඇත් මුහුණක් සහිත ගනේෂ එක වතාවෙක ශිවගේ පුත්‍රයා ය, තවත් වතාවෙක ශිවගේ බිරින්දෑ ය; එයාකාරයෙන්ම, ශිව ද වරෙක ප්‍රේතයින්ගේ යක්ෂයින්ගේ අධිපතියා ය. එහෙත් නපුරු කුඩුකේඩු වේතාල වැන්නන් යක්ෂාධිපතිත්වයෙන් නිදහස් උදවිය හැටියට සැලකෙන් අතර ගැමි ඇදහිල්ල තුළ ඔවුන් ඉතා ජනප්‍රිය ය. ශිවගේ වාහනය ලෙස සැලකෙන නන්දි ගවයා නියෝලිතික යුගයේදී දකුණු ඉන්දියාව තුළ සුලභ ලෙස ඇදහුණු අතර එකල දක්නට ලැබෙන නන්දි ගවයාගේ පිට උඩ මිනිසෙකු හෝ දෙවියෙකු හෝ ගමන්

කරන්නේ නැත. මෙකියන ගවයා නිදහස් ඉන්ද්‍ර ශිෂ්ටාචාරයට අයත් මුද්‍රා අතිවිශාල ප්‍රමාණයක් මත ලැග සිටින්නේ ය' (Kosambi 1977).

ඉහත දක්වන ලද ආගමික-යාතුකර්මීය සංකලනය විසින් අත්කර දෙවන ලද මහා ආනිශංසය නම් බ්‍රාහ්මණයන් විසින් ශිව සහ විෂ්ණු යන දෙවිවරුන් සාදරයෙන් බාරගනු ලැබීම ය. මෙහිදී මතක තබාගත යුතු කාරණය නම් මේ දෙවිවරුන් දෙදෙනාගෙන් එකෙකුවත් මෞර්ය අධිරාජ්‍යයට පෙරාතු බ්‍රාහ්මණ සාහිත්‍යයේවත් බෞද්ධ සාහිත්‍යයේවත් සඳහන් වී නැති බවයි. මේ දෙදෙනාගෙන් එකෙකු වන ශිව, බ්‍රාහමණ දේව පන්තියට ඇතුළු වූවා පමණක් නොව එම දේව පන්තියේ නායක දෙවියා බවටත් පත් විය. ඒ වූකලි ස්වකීය ආර්යත්වය ගැන ඉතාමත් ආඩම්බරයෙන් දොඩන බ්‍රාහ්මණයන් අතර ආර්ය-නොවන දෙවියෙකු ඇතුළු වී පුදුම සහගත අයුරින් ලැබූ උසස්වීමකි. ආර්ය දේවපන්තියේ නායක දෙවියා හැටියට ශිව අත්පත් කරගත් ඒ ආරෝපණය ගැන ශ්‍රීමත් මෝටිමර් වීලර් මෙසේ සඳහන් කරයිඃ 'සංග්‍රාමය දිනුවේ ඉන්ද්‍ර ය, එහෙත් යුද්ධය ජය ගත්තේ ශිව ය' (Wheeler 1992).

ආර්යයන් පීතෘමූලික වූ අතර ඔවුන්ගේ දේවපන්තිය තුළ සිටියේ පුරුෂ දෙවිවරුන් ය. අනාර්ය දේශජ ඉන්දියානුවන් මාතෘමූලික වූ අතර ඔවුන් වන්දනාමාන කළේ ස්ත්‍රී දේවතාවියන් ය. එබැවින් මෙකී ආගමික සංකලන අවධිය තුළ බ්‍රාහ්මණවාදය විසින් පිළිගනු ලැබූ වැදගත් වෙනස නම් ස්ත්‍රීපුරුෂ දෙවිදේවතාවියන් අතර සිදුවන විවාහයි. දෙවිදේවතාවියන් අතර සිදුකෙරෙන විවාහය තුළින් ගම්‍යමාන වන්නේ සමාජය තුළ විවාහය සමාජ සංස්ථාවක් ලෙස ස්ථාපිත වූ බවත් එතෙක් වෙන් වෙන් වශයෙන් ගෝත්‍ර දෙකක් හෝ ඊට වැඩි ගණනක් එක්විටම සමාජයේ ප්‍රධාන ධාරාවට ඇතුළු වී එම සමාජයේ සාමාජිකත්වය ලබාගත් බවත් ය. මේ අනුව, ශිව පාර්වතී විවාහයෙන් ගම්‍ය වන්නේ ශිවගේ මුල් වන්දනාකරුවන් පාර්වතීගේ මුල් වන්දනාකරුවන් සමග එකතු වීමයි. මේ කණ්ඩායම් දෙකම එකවිට මෞර්ය රාජ්‍යයේ සාමාජිකයන් වූ නමුදු කණ්ඩායම් දෙකම අන්තර්ජන්‍ය විවාහය සහ එකගෙයි කෑම එක්තරා දුරකට තමන්ගේම සම්ප්‍රදායන් අනුව පවත්වාගෙන ගියහ.

මෞර්ය ආගමික-යාතුකර්මීය සංකලනයට අයත් මෙම නව දෙවිවරුන් සංකල්පනය කරන ලද්දේ මිනිස් ප්‍රාණීන්ගේ හැඩතල සහ රූපකායන් අනුව වුව ද එම රූපවලට බොහෝ ඉස්ගෙඩි සහ බොහෝ අත් දෙන ලද්දේ එම දෙවිවරුන් නියෝජනය කරන ගෝත්‍රවලට අයත් තෝටමික සංකේත නිරූපණය කිරීම සඳහා ය. එහි ප්‍රතිඵලයක් හැටියට, ශිව රූපය නිර්මාණය කරන ලද්දේ හිස් ගණනාවක් අත් ගණනාවක් තිබෙන මිනිස් රූපයක් ලෙසින් ය. ඒ හිස් සහ අත් සංඛ්‍යාව මගින් නියෝජනය වන්නේ ශිව නායකත්වය දෙන ගෝත්‍රික ප්‍රජාවන්ගේ ප්‍රමාණයයි. එබැවින් ශිව හෝ විෂ්ණු හෝ වෙනයම් දෙවිදේවතාවියක හෝ දරා සිටින උපත ලබාදෙන මෙවලම්වලින් කියැවෙන්නේ ඒ ඒ අනන්‍යතාවන් සහිත ප්‍රජාවන් බොහෝ ගණනක් එකතු වී මිශ්‍ර වී වඩා විශාල සමාජයක් ගොඩනගාගැනීමේ කතන්දරයයි.

ප්‍රධාන ධාරාවේ සමාජයට අයත් සාමාජිකයන් සහ ගෝත්‍රික ප්‍රජාවට අයත් ජනයා ඒකාබද්ධ කරවනු සඳහා බ්‍රාහ්මණ පූජක තන්ත්‍රය විසින් යොදාගන්නා ලද ගලපගන්නා ලද ප්‍රධානම සාධකය වූයේ ගෝත්‍රික ජනයා අතර බහුල ලෙස භාවිතයේ පැවති මුතුන්මිත්තන් වන්දනා කිරීම බව අවධාරණයෙන් කිව යුතු ය. මේ කාරණය හේතුකොටගෙන මෙතෙක් දෙවියන් සමග ගෝත්‍රික ප්‍රජාවල සාමාජිකයන් සමෝධානගතකිරීම සාමකාමී ලෙස සිද්ධ වියඃ කළ යුතුව තිබුණේ එක්කෝ ගෝත්‍රික වන්දනාව ප්‍රධාන ධාරාවේ සමාජයට පිළිගත හැකි අන්දමට සකස් කරගැනීම ය; නැත්නම් ප්‍රධාන ධාරාවේ සමාජයට අයත් වන්දනාව ගෝත්‍රික ප්‍රජාවට පිළිගත හැකි අන්දමට නැවත සකස් කරගැනීම ය. සැබෑ ලෙස සිද්ධ වූයේ කුමක් දැයි සමීපව සලකා බැලුවහොත් පෙනී යන්නේ මේ ක්‍රියාවලිය දෙපැත්තටම සිදු වූ බව ය. සමෝධානයෙන් පසු ප්‍රධාන දෙවියා හැටියට මතු වී ඇත්තේ ආර්ය-නොවන දේශජ දෙවියෙකි. ඒ දෙවියා ප්‍රධාන ධාරාවේ සමාජය වෙතින් මහත් පිළිගැනුමක් දැන් අත්කරගෙන ඇත්තේ ය. ඒ සමගම, ඒ ප්‍රධාන දෙවියා, සමෝධානගත ගෝත්‍රික ප්‍රජාවන් සතු වන්දනාමාන ක්‍රම සියල්ල ද සංයෝජනය කරගෙන ඇත්තේ ය. කෙසේ වෙතත්, මෙහිදී අපගේ අවධානයට භාජනය විය යුතු ප්‍රධාන කාරණය නම් යථෝක්ත ක්‍රියාවලිය විසින් කිසිම ගැටළුවක් මතු නොකිරීමේ කාරණයයි.

මන්ද කියනවානම්, එසේ ගැටළු මතු නොවූයේ එක්කෝ මෙම ක්‍රියාවලියට සහභාගී වූ සියලුම පාර්ශව දෙවියන් වන්දනා කරන්නවුන් බවට පත්වීම නිසා ය, නැත්නම්, දෙවියන්ගේ තත්ත්වයට උසස් කරනු ලැබූ නිසා ය, එසේත් නැත්නම් මේ කාරණා දෙකම නිසා ය. මේ සියලු යථෝක්ත කාරණා හේතුකොටගෙන සංකල්පීය ගැටුම් පැන නගින්නට අවකාශ තිබුණේ නැත.

පෙනෙන හැටියට, යථෝක්ත ආගමික-යාතුකර්මීය සංකලනය හේතුකොටගෙන අධිරාජ්‍යයේ දෙශසීමාබඳව පිහිටා තිබූ ඝණ වනාන්තරවල තනි වී වාසය කළ ගෝත්‍රික ප්‍රජාවන්ගේ එම තනිකම ක්‍රමයෙන් නැති වී යන්නට පටන්ගත් කල එම විපරිවර්ත්තනය මුළුමහත් සමාජ ව්‍යුහයටම බලපාන්නට පටන්ගෙන තිබුණි. එම විපරිවර්තනයේ ප්‍රතිඵලයක් හැටියට නව දෙවිවරුන්, නව වැඳුම් පිදුම් ආකෘති, මේ දෙවිවරුන් සඳහා නිර්මාණය කළ නව වතාවත් ගලපාගනු ලැබී ය. මේ දේවිවරුන් වූකලි එක්කෝ මෑතකදී දේව තත්ත්වයට උසස් කරනු ලැබූවන් විය, නැත්නම් ශිවගේ වාහනය ලෙසින් දිව්‍යත්වයට පත්කරන ලද නන්දි නම් ගවයා මෙන් විපරිවර්තනය කරනු ලැබූවන් විය. මෙයාකාරයෙන්, බ්‍රාහ්මණ දේවපන්තිය සංඛ්‍යාව අතින් ඉහළ යෑමේ කාරණය මගින් කියැවුණේ නිමක් නැති තරම් කුඩා හා ලොකු ප්‍රජාවන් සංඛ්‍යාවක් ඒකාබද්ධ වෙමින් මධ්‍යම දේශපාලන රාජ්‍යයේ ජනගහණය ගොඩනැගුණු බව ය.

එම අවධියේදී බලවත් ලෙස ව්‍යාප්තව තිබූ එකම ආගම බ්‍රාහ්මණවාදය නොවෙන නිසා යථෝක්ත සුවිශාල ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය ඉන්දියාවේ තිබූ අනෙක් ආගම්වලටත් බලපෑ අන්දම සොයා බැලීම මෙහිදී අදාළ කාරණයකි. බුද්ධාගමට එකී ප්‍රතිසංස්කරණ ව්‍යාපාරය බලපෑ අන්දම දැන් සොයා බලමු. අවාසනාවකට මෙන්, බුද්ධාගම තුළ සමාජ හා ආගමික මට්ටමින් සිදුවී ඇත්තේ මොනවා දැයි සොයා බැලීම සඳහා උදවු කරගත හැකි ලිඛිත වාර්තා මෙතෙක් සොයාගන්නට පිළිවන් වී නැත. අප වෙත ඇත්තේ න්‍යායික කරුණු පාදක කරගෙන බුද්ධ ශාසනයේ ශ්‍රාවකයින් අතර සිදුවූ බෙදීම් ගැන කියාපාන වාර්තා කීපයක් පමණි. හින්දු ධර්ම සමය තුළ සිදුවූ ප්‍රතිසංස්කරණ බුද්ධාගමට බලපෑවේ කෙසේ ද යන්න

එදවස පැවති බෞද්ධ වාදවිවාදවලදී මෙන්ම ධර්ම සංගායනාවලදී සලකා බලන ලද බවට කිසිදු සාක්ෂි ද ඇත්තේ නැත. එහෙත් අශෝක අධිරාජයා බුද්ධාගම වැළඳගන්නා කාලය වන විට බෞද්ධයින් ද යාතුකර්ම හා වතාවත් ඕනෑම ආගමකට නැතුවම බැරි අංග යැයි කියමින් ඒවා පිළිගෙන තිබූ බවක් පෙනී යයි. ඔවුන් එසේ කර ඇත්තේ මෙකියන යාතුකර්ම හා වතාවත් ගැන පාලි සූත්‍රපිටකවල කොහෙත්ම සඳහන් වී නොතිබෙද්දී ය!

'පාලි සූත්‍ර' යන පදය ගැන කිසියම් පැහැදිලි කරගැනීමක් ගොඩනගාගැනීම මනා ය. පාලි සූත්‍ර යන පදය පාවිච්චි කොට ඇත්තේ මුල්ම කාලයේදී දක්නට ලැබෙන නිකාය හතරට අයත් පඨිත සඳහා ය. සුප්‍රකට අට්ඨකථාචාර්ය බුද්ධඝෝෂ හිමියන් ද පස්වැනි නිකායට අයත් පඨිත පශ්චාත් සූත්‍ර බව පිළිගෙන ඇතත් මහාවිහාරය පාර්ශවය විසින් එම කාරණය ප්‍රතික්ෂේප කොට එය අභිබවා කටයුතු කර තිබෙන බව පැහැදිලි ය. මෙහිදී පැන නැගුණු භේදය මතවාදී එකක් බව අප මතක තබා ගත යුතු ය. පශ්චාත් සූත්‍ර පඨිතවල දක්නට ඇත්තේ එක්කෝ මුල්කාලීන සූත්‍ර පඨිතවල දක්නට නොලැබෙන භාවිතාවල සහාය දක්වන පාඨ ය, නැත්නම් බුදුන්ගේ මූලික උගැන්වීමට පරස්පර වන ඒවා නිශේධ කරන පාඨ ය.

ඉදින්, දැන් නැවතත් අපගේ මුල් සාකච්ඡාව වෙත ගියොතින් වඩා පහසුවෙන් කරුණු අවබෝධ කරගන්නට පිළිවන් ය. එදවස සිටි බෞද්ධයෝ ශුද්ධස්ථාන සහ වන්දනාස්ථාන වැඳීම පිදීම තම ආගමේ කොටසක් වශයෙන් සැලකූහ. ලුම්බිණිය වෙත ගොස් බුදුන් උපන් ස්ථානයෙහි අනුස්මරණ ටැඹක් පිහිටුවීම වැදගත් කාරණයක් හැටියට අශෝක අධිරාජය කල්පනා කළේ ඒ නිසා ය.

මේ කාලය වන විට බෞද්ධයන් බෝධි වෘක්ෂය වඳින්නට පටන්ගෙන තිබූ බව උද්ගමනය කළ හැක්කේ මහින්ද හිමිගේ ඉල්ලීම පිට අශෝක රජු බුද්ධගයාවේ තිබෙන බෝධි වෘක්ෂයේ රෝපණයක් ඒ හිමියන්ට ලබා දුන් බැවිනි. රාමග්‍රාමයේ විසූ කෝලිය ප්‍රජාවට ලැබුණු බුදුන්ගේ සර්වඥ ධාතු පංගුව නිදන් කොට ගොඩනැගූ සෑය හාරා එහි තිබූ ධාතු ඉවත් කොට ඒවා නැවත නිදන් කරමින් අශෝක රජු ස්වකීය අධිරාජ්‍යය පුරා සෑයවල්

ඉදි කළ බැව් වාර්තාගත වී තිබේ. මේ කාරණයෙන් ද පැහැදිලි වන්නේ ඒ වන විට බෞද්ධයන් ධාතු වන්දනාවේ ද නියැලී සිටි බව ය.

රාමග්‍රාම ස්තූපයේ තිබුණු සර්වඥ ධාතු පිළිබඳව රසවත් පුරාවෘත්තයක් ද අප අතරේ භාවිතයේ පවතී. දුටුගැමුණු රජතුමාට රුවන්වැලි සෑයේ තැන්පත් කිරීම සඳහා සර්වඥ ධාතු අවශ්‍ය වූ විට රජතුමා සෝනුත්තර හිමියන් නාග ලෝකයට පිටත්කර හරියි. බෞද්ධ විශ්වවේදය අනුව නාග ලෝකය පිහිටා තිබෙන්නේ මහ සමුදුරු පතුලේ ය. ඒ වාගේම ලංකාවේ සුපතළ මේ පුරාවෘත්තය තවත් රසවත් කතන්දරයක් ද පවසයි. දඹදිව රාමග්‍රාමයේ තිබූ ස්තූපය මහා ගංවතුරකට හසුව කැඩී බිඳී ගොස් එහි තැන්පත් කොට තිබූ සර්වඥ ධාතු අඩංගු පාත්‍රය ජල පහරට ගසාගෙන ඇවිත් මහ මුහුදට එක් විය. එය සොයා ගන්නා ලද්දේ නා රජු විසින් ය. මෙකියන රාමග්‍රාමය ඉන්දියාවේ පිහිටා තිබෙන්නේ කඳු පන්තියකින් වටවූ තවත් කන්දක් මුදුනේ බවත් අජාසත්තු සහ අශෝක යන දෙදෙනාටම සර්වඥ ධාතු එහි නිරුපද්‍රිතව තිබී හමු වූ බවත් මේ පුරාවෘත්තය ගෙතූ උදවිය දැනගෙන නොසිටි බව පැහැදිලි ය (Kosambi 1977; Marasinghe 2009).

ඇත්තෙන්ම, වතාවත් සහ යාතුකර්ම බෞද්ධයන් විසින්ම අනුගත කරගත්තා ද නැත්නම් බෞද්ධයින්ට පිටතින් ලැබුනා ද යන්න පැහැදිලි නැත. බෞද්ධයන් විසින්ම අනුගත කරගත්තානම්, පාලි සූත්‍රවල දැක්වෙන ධාර්මික ඉගැන්වීම්වලට පටහැනි නොවෙමින් ඒවා අනුගත කරගන්නට සහතික වූවා දැයි පැහැදිලි නැත. බෞද්ධ භාවිතාවට බෞද්ධ යාතුකර්මවල සහ වතාවත්වල තිබෙන අදාළත්වය පිළිබඳ සාකච්ඡාවක් හෝ විවාදයක් හෝ ශාසන ඉතිහාසය පුරාම කුමනාකාරයෙන් හෝ දක්නට නොලැබීමෙන් පෙනී යන්නේ ශාසන භාරකරුවන්ගේ අවධානයට එය හසු නොවූ බවයි. ඒ නිසාම, මහා අන්තරායකාරී ආනිශංස රාශියක් මේ වන විට අත් වී තිබෙන බවත් විකෘතයන්ගෙන් තොර වූ බුද්ධාගමට කළ හැකි සුවිශාල දායකත්වය වර්තමාන සමාජයට ලබා දෙන්නට ඊට නොහැකි වී තිබෙන බවත් පෙනී යයි.

ථෙරවාද සංකල්පනයට අනුව, බුදුන් වනාහි මිනිසෙකුට ළඟා විය හැකි ඉහළතම ආධ්‍යාත්මික තලයට ප්‍රවේශ වූ මිනිස් ගුරුවරයෙකි. එසේ ප්‍රවේශ වීමෙන් අනතුරුව ස්වකීය අවශේෂ ජීවිත කාලය පුරාම එම ඉගැන්වීම් ප්‍රචාරය කිරීම සඳහා වෙහෙසුණු අයෙකි. බුදුන් ශ්‍රේෂ්ඨතම මිනිස් ගුරුවරයෙකු හැටියට බැතියෙන් පුදනු ලබන්නේ එබැවිනි. බුදුන්වහන්සේගේ ගෝලයින් සහ අනුගාමිකයන් එතුමන් ඇදහුවේ නැත. ඒ වෙනුවට, ඔවුන් කළේ එක්කෝ එතුමන්ගේ ඉගැන්වීම් අනුගමනය කොට විමුක්තිය ලබාගැනීම ය, නැත්නම් තෘප්තිමත් මිනිසුන් හැටියට සමාජයේ ජීවත් වීම ය. එහෙත් අද අපි වෙනත් දෙවිදේවතාවන්ට පුදන දේවල්ම බුදුන්ට පුදමින්, වෙනත් දෙවිදේවතාවන්ට කරන කන්නලව්ම බුදුන්ටත් කරමින්, බුද්ධ වන්දනාවේ යෙදෙන්නෙමු. එසේ යෙදෙමින්, කැපකිරීම් පූජාවන් යාඥාවන් පිළිගන්නා දෙවිදේවතාවුන් කියා පිරිසක් නැති බව කියා දෙන බුද්ධ වචනයට තරයේ විරුද්ධ වන්නෙමු. ඉදින්, මේ වන විට යැද්ද විට පිහිටවන ගෝත්‍රික දෙවියෙකුගේ හෝ වෙනත් මොනයම් හෝ දෙවියෙකුගේ තත්ත්වයට වර්තමාන බෞද්ධාගමිකයා විසින්ම බුදුන්ව ඇද දමා තිබෙන බව පැහැදිලි ය. කාරණය මොන තරම් බරපතල ද යන්න පැහැදිලි වන්නේ අද දවසේ කිසිම කරදර උපද්‍රවයකින් තොරව මේ භාවිතාව යසරඟට එකදිගට සිදුවෙමින් තිබෙන බැවින් ය.

අපගේ අවධානය ඇද ගන්නා යාතුකර්මීය වන්දනා අතුරෙන් තවත් එකකි බෝධි වන්දනාව. බෞද්ධයන් බෝධි වන්දනාවේ යෙදෙන්නේ බුද්ධත්වය ලැබීම සඳහා බෝධි වෘක්ෂය බුදුන්ට පිහිට වූ බැවිනි. එදා මහාමේඝ වනෝද්‍යානය තුළ මෙකී බෝ ගස පැළ කළ විට එතෙක් නුග ගස් පොල් ගස් වන්දනා කරමින් සිටි ජනයා මහත් භක්තියෙන් යුතුව බෝ ගස වඳින්නට පටන් ගත්හ. සැබවින්ම, සිද්ධ වී ඇත්තේ ඒ තාක් කල් විශේෂ වන්දනාව සඳහා යොදාගත් සියලු යාතුකර්මීය භාණ්ඩ යොදා ගනිමින් බෝධිවන්දනාවේ යෙදෙන්නට ද පටන් ගැනීමයි. නුග ගස් සහ වෙනත් තාල වර්ගයට අයත් ගස් වන්දනා කරන ලද්දේ එම ගස් දෙවියන්ගේ සහ අමනුස්සයන්ගේ වාසස්ථාන යැයි සලකාගෙන ය. මේ දක්වාම විශ්වාස කරන්නේ බෝ ගස ද සුවපත් කිරීමේ සහ වෙනත් හාස්කම් කිරීමේ සමත් බලවේගවල වාසස්ථානය හැටියට ය. අනුරාධපුරයේ තිබෙන ශ්‍රී මහා

බෝධිය දැක බලාගන්නට ගියොතින් පූජාභාණ්ඩ විකුණන, ගාස්තුවක් අයකොට බෝධි වෘක්ෂයට කන්නලව් කරන, කපුරාළලා අතිවිශාල ප්‍රමාණයක් ද දැක්ගත හැකිය.

බුද්ධාගම ලංකාවට හඳුන්වා දුන් කාලයේ මෙරට පැවති තවත් වන්දනාක්‍රමයක් නම් තමන්ටම ආවේණික ලබ්ධි ගොඩනගාගත් දෙවිවරුන් තනි තනි වශයෙන් ගෙන වන්දනා කිරීම ය. ලංකාව බෞද්ධ මෙහෙවරය සඳහා තෝරා ගැනීමෙන් පසුව මිහිඳු හිමියන් අශෝක අධිරාජ්‍යයේ අද්දර පිහිටි ස්වකීය මෑණියන්ගේ ජන්මභූමිය වන වේදිසාගිරි නුවර මාස කීපයක් නැවතී සිටි බැව් වාර්තාගත් වී තිබේ. එහිදී මිහිඳු හිමියන්ට අප ඉහත සාකච්ඡා කළ ආගමික යාතුකර්ම සහ සංස්කෘතික භාවිතාව ඕනෑතරම් දැක බලාගන්නට හැකි විය. මේ විවෘත වීම තුළින් හිමියන් ලබාගත් දැනුම පසුව ගස් ගල් වඳින අදෘශ්‍යමාන දෙවිවරුන් වඳින ගෝත්‍රික ජනයා බෞද්ධාගම්කාරයින් බවට විපරිවර්තනය කිරීම සඳහා පහසු ප්‍රවේශයක් ලෙස යොදා ගනු ලැබිණ. එහෙත් ඒ හිමියන් බලාපොරොත්තු වූ විපරිවර්තනය කිසිවිටෙක සිද්ධ වූයේ නැත. පූර්ව-බෞද්ධ ලාංකිකයෝ නව ආගමේ ආරක්ෂාව යටතට පත්වුනායින් පසුව පෙර පුරුදු කළා වූ ගස් ගල් දෙවිදේවතාවුන් වැඳීමේ යාතුකර්මය ද මුරණ්ඩු ලෙස භාවිත කළා පමණක් නොව බුදුන්වහන්සේ එකහෙළාම ඉඳුරාම ප්‍රතික්ෂේප කළ මිථ්‍යාවිශ්වාසය සහ දේව ආසක්තය ථෙරවාද සම්ප්‍රදාය තුළට ගෙන එමින් එහි නිර්මලත්වය නසා දැම්මාහ. නෑ යකුන් සහ ලබ්ධි දෙවියන් වන්දනා කරන උදවිය අදේවවාදී බෞද්ධාගම්කාරයින් වනවා වෙනුවට, යථෝක්ත විශ්වාසවලට යාතුකර්මීය ව්‍යුහය තුළ ඉතා වැදගත් තැනක් ලබා දෙමින්, බුද්ධාගමේ ලාංකීය පිටපතට නෑ පරපුර ඇදහිල්ල සහ දේව ඇදහිල්ල ද ඈඳාගනු ලැබී ය.

ලංකාවට බුද්ධාගම ගෙනැවිත් ව්‍යවහාරයට ප්‍රවේශ කරවූ මුල් කාලය තුළදීම සිද්ධ වුණු මේ විපර්යාසය ඉතා දැඩි බලපෑමක් කළ හෙයින් මහින්ද හිමියන් ද ඒ ගැලපුම් අනුමත කළ වගක් පෙනේ. මෙහිදී පැන නගින මූලික ප්‍රශ්නය නම් මහින්ද හිමියන්ට හෝ වෙන කාටවත් හෝ මේ දෙමුහුනය, මේ සම්මිශ්‍රිතය ඇති කිරීම සඳහා අධිකාරී බලයක් තිබුණා ද යන්න ය. දීඝනිකායේ සඳහන් මහාපරිනිබ්බාන සූත්‍රයේ දැක්වෙන පරිදි,

බුදුන් විසින් වදාළ මොනතරම් බලසම්පන්න වේවා නොවේවා කිසිදු තනි භික්ෂුවකට හෝ භික්ෂුන් පිරිසකට හෝ බෞද්ධ ධර්මයේ දැක්වෙන ආගමික භාවිතාවන්ට වෙනස්කම් හඳුන්වා දෙන්නට ප්‍රථමයෙන්, ඉගැන්වීම්වලට නව අර්ථකථන සපයන්නට ප්‍රථමයෙන්, ඒවා සතර නිකායට අයත් පාලි සූත්‍ර පිටකවල දැක්වෙන ඉගැන්වීම්වලට අනුකූල ද නැද්ද යන්න පරීක්ෂණයක් පැවැත්විය යුතු ය. බරපතලම කාරණය නම්, පාලි සූත්‍ර පිටකවල සඳහන් ඉගැන්වීම්වලට හාත්පසින්ම විරුද්ධ ඉගැන්වීමක් වන නෑ පරපුර වන්දනාවට සහ දෙවිදේවතාවුන් වන්දනාවට ඉඩ දී නිහඬව සිටීමෙන් මහින්ද හිමියන් එකී සතර මහා මාහෝපදේශ කිසිසේත් නොසැලකීමයි.

පිරිනිවන් පාන්නට තුන්මසකට කලින් බුදුන්වහන්සේ වදාළ ඉතා පැහැදිලි එම සතර මහා මහෝපදේශ නොතකා එදා දවසේ වැජඹුණු ලාංකේය දේශපාලන අධිකාරයත් බුද්ධ ශාසනයේ සාමාජිකයනුත් බුද්ධාගම තුළට වතාවත් සහ යාතුකර්ම හඳුවාදීම හේතුවෙන් බෞද්ධ සම්ප්‍රදාය සතුව තිබූ නිර්මලභාවය මේ වන විට කෙළෙසී දරුණු ඵලවිපාකවලට එම සම්ප්‍රදායට මුහුණ දෙන්නට සිදු වී තිබෙන බව දැන් පැහැදිලිව පෙනී යයි. ආදිකල්පික ආගම්වල සහ වෙනයම් දේවවාදී ආගම්වල එන දෙවිවරුන්ට සාමාන්‍යයෙන් පුදනු ලබන පිදේනිවලින් වට කොට ඒ මහා මානුෂික ගුරුවරයාට අවමන් අපහාස කරන අන්දම මීට පෙරාතුව මෙම ලිපියේදී සකච්ඡා කර ඇති බව මේ අවස්ථාවේ සිහියට නගාගැනීම වටී. අපගේ ඓතිහාසික වාර්තාවලට අනුව, බුද්ධ රූපවලට ආහාර සහ ආභරණ පූජා කිරීම හඳුන්වාදෙන ලද්දේ තුන්වැනි සේන රජු සමයේදී ය (Geigher 1927: 175). තවත් අවස්ථාවකදී ආරියදේව නම් භික්ෂුවක් කිසිදු අවසරයකින් තොරව බෝධිපූජා නම් යාතුකර්මය හඳුන්වාදීමෙන් පසු එය ජනයා අතර ඉතාමත් ශීඝ්‍රයෙන් ප්‍රචලිත විය.

අද දවසේ ආගමික භාවිතාව ලෙස නම් කොට අභ්‍යාස කරනු ලබන බොහොමයක් යාතුකර්මවල අරමුණ වී ඇත්තේ තමන් බෞද්ධයන් හැටියට හඳුනාගන්නට සාමාන්‍ය නූගත් ජනයාට උදව් වීම බව සමහරු තර්ක කරමින් පෙන්වා දෙති. ඒ කුමන කතන්දර කිව්වත් බෞද්ධයන් බෞද්ධාගම තුළම රඳවා තබා ගැනීම සඳහා භාවිත කරන්නේ නෑයන් සහ

දෙවිදේවතාවුන් ඇදහීම නම් ආදිකල්පික යාන්ත්‍රණයයි. ඉදින්, මේ අවස්ථාවේදී අනුකම්පා විරහිත ලෙස සඳහන් කළ යුත්තේ, ආධ්‍යාත්මික වශයෙන් මෝරා ප්‍රගතිය ලබා ගැනීමේ ආධ්‍යාපනික මාර්ගය සකස් කොට සාමාන්‍ය දුප්පත් බෞද්ධ බැතිමතාට එකී අධ්‍යාපනය ලබා දීම සඳහා කිසිදු උත්සහයක් නොගෙන ඔවුන් එකම මට්ටමින් එක දිගටම තබාගෙන සිටීම මහා අපරාධයක් බවයි. අද සිටින පණ්ඩිත රාළලා මෙන් බුදුන්වහන්සේ ද බැතිමතුන් මිථ්‍යාමත හා යාතුකර්ම අතාරින්නට අකමැති නිසා 'කමක් නෑ ඔහේ කරගත්තාවේ' යි සිතා කල් යැවුවා නම් විමුක්තිය අත්පත් කරගැනීමේ තාක්ෂණවිධිය සොයා ගැනීම සඳහා පරිපාකයට පත්වන්නැයි උපදෙස් නොදී 'හා එහෙනම් ගිහි ජීවිතයට ආයෙත් යන්නැ' යි කියමින් චූලපන්ථකට උපදෙස් දෙනවා නියත ය. අප අද ගලපාගත යුත්තේ යථෝක්ත තාක්ෂණවිධියයි. එසේ නොමැතිව ආයෙත් කවදාවත් ගොඩ එන්නට බැරි ආදිකල්පික මිථ්‍යාමත සහ යාතුකර්ම නමැති මඩගොහොරුවට බොදු බැතිමතුන්ව දක්කාගෙන යෑම නොවේ.

මේ අනුව බලන කල, අද දවසේ අවශ්‍යතාව වන්නේ ගෝත්‍රික ආගම්වල අඩංගු මිථ්‍යාමත, යාතුකර්ම, දේව වන්දනාව ආදී රෝගී භාවිතාවන්, පාලි සූත්‍රවල සඳහන් බුද්ධාගම යැයි කියමින්, කිසිදු විචාරයකින් තොරව වැඩිදියුණු කරමින් පතුරුවා හැරීම නොවේ. යටත් පිරිසෙයින්, බුද්ධාගම සතු සුවිශුද්ධ මුල් භාවිතාවන් නැවත ආරෝපණය කොට තහවුරු කිරීමේ යාන්ත්‍රණයක් හෝ පිහිටුවා ගැනීම ය. එසේ නොකළොතින්, අද්‍යකාලීන ලෝකය ඉදිරිපත් කරන අනේකවිධ අභියෝගවලට මුහුණ දෙන්නට බුද්ධාගමට නුපුළුවන් වෙනවා ඇත. එසේ නොකළොතින්, දැනට ආගමික වශයෙන්, දේශපාලන වශයෙන් බුද්ධාගම මත්තේ ආධිපත්‍යය පතුරුවාගෙන සිටින බලවේගවල ග්‍රහණයට හසු වී වැඩි කල් නොගොස් බුද්ධ ධර්මය පිරිනිවන් පානවා නිසැක ය. දීඝ නිකායේ පරිනිබ්බාණ සූත්‍රයට අනුව, තීරණ ගැනීම සඳහා බෞද්ධ අධිකාරය තුමූ සවිබල ගන්වාගත යුත්තේ බුදුන්ගේ ඉගැන්වීම්වලට අනුව ය. එසේ නොමැතිව, පාලි සූත්‍ර පිටකවල සඳහන් ධර්ම කොටස්, පශ්චාත් සූත්‍ර පිටකවල සඳහන් ධර්ම කොටස් අනුගමනය කිරීමෙන් නොවේ. බුදුන්ගේ ඉගැන්වීම් වෙනුවෙන් ඉදිරිපත් කෙරෙන ඕනෑම නව භාවිතාවක් හෝ අර්ථනිරූපණයක් හෝ පිළිගන්නට හෝ ප්‍රතික්ෂේප කරන්නට හෝ

පෙරාතුව ඒවායේ වලංගුතාවය පරීක්ෂා කරනුවස් බුදුන්ගේ ඉගැන්වීම් සමග ඒවා සන්දර්භගත කළ යුතු යැයි එම සූත්‍රයේ පැහැදිලිව කියා තිබේ. ඉදින්, වර්තමාන අද්‍යකාලීන දෙමුහුන් සම්මිශ්‍රිත බුද්ධාගම නිරවශේෂයෙන් ගෙන පවිත්‍ර කළේ නැත්නම් නිර්මල කළේ නැත්නම් නොබෝ දිනකින්ම බටහිර ලෝකයේ කිසියම් රටක් විකෘතියට භාජනය නොවූ බුද්ධාගමේ මධ්‍යස්ථානය බවට පත්වනවා ඇත. අද දවසේ අපේ රටේ වෙසෙන බෞද්ධාගම්කාරයින්ගේ බහුතරය සමන්විත වී ඇත්තේ ඉහත කී ආදිකල්පික ආගම් අදහන පුගුලන්ගෙනි.

*මහාචාර්ය එම්. එම්. ජේ. මාරසිංහ කැලණිය විශ්වවිද්‍යාලයේ සේවය කළ උපකුලපතිවරයෙකි. ඔහු එම විශ්වවිද්‍යාලයේ පාලි සහ බෞද්ධ අධ්‍යනාංශයේ ජ්‍යෙෂ්ඨ මහාචාර්යවරයෙක් වූ අතර ඔහු මෙලොවින් සමුගෙන දැන් දෙවසරකි.*

## ආශ්‍රිත ග්‍රන්ථ

Geiger, Wilhelm (ed.), 1927. *Culavamsa*. Pali Text Society.

Kosambi, D.D., 1977. *Culture and Civilization of Ancient India.* Vikas Publishing House.

Marasinghe, M.M.J., 2009. *Gods in Buddhism*. Sarasavi.

Wheeler, Mortimer, 1992. *Five Thousand Years of Pakistan.* Royal Book Company.